**පරන්තන් කෙමිකල්ස් කොම්පැණි ලිමිටඩ් - 2022**

**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පරන්තන් කෙමිකල්ස් කොම්පැණි ලිමිටඩ් ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.4 | සමාලෝචිත වර්ෂයේදී කි.ග්‍රෑ.900 ක්ලෝරීන් සිලින්ඩර් 196 ක් මිලදී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යොදාගෙන තිබූ අතර උපරිම තරඟයක් ඇති කිරීම තහවුරු කිරීම සඳහා විවිධ මාධ්‍ය මගින් ප්‍රසම්පාදන දැන්වීම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරණයක් ලබාදිය යුතු බවට ප්‍රසම්පාදන අස්ථිත්වයට නියම කර තිබුණද සමාගම විසින් පරන්තන් සමාගමේ හා කර්මාන්ත අමාත්‍යාංශයේ වෙබ් අඩවි 2 හි පමණක් දැන්වීම පලකර තිබුණි. අඩු ප්‍රචාරය හේතුවෙන් මේ සඳහා ආයතන 4 කින් ලංසු ඉදිරිපත් වී තිබුණු අතර ඉන් ආයතන 2 කින් පමණක් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර තිබුණි. | කර්මාන්ත අමාත්‍යාංශය වෙබ් අඩවියේ සහ සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ වෙබ් අඩවි වල දැන්වීම පල කිරීම මගින් ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවා ඇති අතර මෙම කාල සීමාව තුල ශ්‍රී ලංකාව තුල කොරෝනා වසංගතය පැතිරීම හේතුවෙන් රාජ්‍ය ආයතන වල කටයුතු, ගමනාගමන කටයුතු, බැංකු කටයුතු දැඩි දුෂ්කරතාවයන් පැවති අතර විදේශ විනිමයන්හි රාජ්‍ය බැංකු තුල දැඩි හිඟයක් පවතින ලදී.<br>උක්ත විෂයගත ටෙන්ඩරය මෙම වකවානුව තුල දැඩි අපහසුතා මධ්‍යයේ ටෙන්ඩරය විවෘත කොට ලෝකයේ දැඩි නැව් මාර්ග වල සහ නැව් ගමනාගමනය අසීමිත දුෂ්කරතා මධ්‍යයේ සිදු කල ප්‍රසම්පාදන කටයුත්තක් බැව් දැනුම් දෙන අතර එය තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය පරිදි නියමිත ප්‍රසම්පාදන පිළිවෙත් වලට අනුව කාලීන අවශ්‍යතාවය මත දුෂ්කරතා මැද සිදුකල ප්‍රසම්පාදනයක් බව ප්‍රකාශ කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් | 2023 වර්ෂයේදී අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛයපරිදි කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | කල යුතු වුවත් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2023 ජුනි 14 දින එනම් මාස 3 ක් හා දින 15 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලද අතර, විගණිත දිනය වූ 2023 ඔක්තොබර් 02 දින තෙක් එකී වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් නොවීය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 362,358,886 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 138,180,996 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.224,177,890 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ක්ලෝරීන් සිලින්ඩර් විකුණුම් ආදායම රු.307.3 ක් කෝස්ටික් සෝඩා විකුණුම් ආදායම රු.මි. 28.3 හා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. මි. 70.08ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරන්තන් කෙමිකල්ස් සමාගමට අයත් කි.ග්‍රෑම් 900 හිස් සිලින්ඩර් 28 ක් (බහලුම් 2 ක්) හා සමුද්‍රා සමාගමට අයත් කි.ග්‍රෑම් 1000 හිස් සිලින්ඩර් 14 ක් (බහලුම් 1 ක් ) 2022 ඔක්තෝබර් 07 දින ලංකා වරායෙන් බංගලාදේශයේ සී/ස සමුද්‍රා කෙමිකල්ස් කම්ප්ලෙක්ස් ලිමිටඩ් (Samudra Chemicals Complex ltd) ආයතනය වෙත යවා තිබුණි. එම නෞකාව බංගලාදේශයේ චිතගොං වරාය වෙත පැමිණි බව 2022 ඔක්තෝබර් 13 දින සමාගම වෙත ලිඛිතව දැනුම් දී තිබුණද සමාගමේ සැපයුම් අංශය විසින් අදාල ඉන්වොයිසිය හා පැටවුම් වලට අදාල ලේඛන 2022 නොවැම්බර් 30 දින වන විටත් සී/ස සමුද්‍රා කෙමිකල්ස් ආයතනය වෙත ලබා දී නොතිබුණි. එම ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා දියර ක්ලෝරීන් ආනයනය කිරීම සඳහා භාවිතා කරන හිස් සිලින්ඩර් නියමිත කාලසීමාව තුළ මුදා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සමාගමට රු.6,830,145 ක ප්‍රමාද ගාස්තුවක් සී/ස සමුද්‍රා කෙමිකල්ස් කම්ප්ලෙක්ස් ආයතනය වෙත ගෙවීමට සිදුවී තිබුණි. එසේම අදාල පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ, නාමගල් මහත්මියගේ සහභාගිත්වයෙන් නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව මේ වන තෙක් සමාගමට ලැබී නොමැත. වාර්තාව ලැබුනු පසු එහි නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | සමාගමට අලාභයන් ඇති නොවන ලෙස කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පරන්තන් භූමියේ අක්කර 20 ක ප්‍රමාණයක වී වගා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර මේ වෙනුවෙන් භූමිය සකස් කිරීම, වී මිලදී ගැනීම, ආරක්ෂිත වැටක් ඉදිකිරීම ඇතුළු කාර්යයන් සඳහා රු.1,706,748 ක් සමාලෝචිත වර්ෂයේ දී වැයකර තිබුණි. සමාගම මිලදී ගත් බිත්තර වී බුසල් 60 න් බුසල් 13 ක් වපුරා තිබුණ ද, වැපිරිය යුතු නියමිත කාලය පමා කර වැපිරීම නිසා මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. | මේ වනවිට මෙම බිත්තර වී සහල් කර විකිණීම සඳහා සූදානම් කර ඇත. තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි වී වගා කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. මෙය හුදෙක් වී වගාවේ ආරක්ෂාවට පමණක් නොව රේඛිය අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි, ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස භූමිය ආරක්ෂා කිරීම සහ අනවසර පදිංචි වීම් වැලැක්වීම උදෙසා මෙමෙ ආරක්ෂිත වැට ඉදි කරන ලදි. තවද මෙය සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ ප්‍රාග්ධන ව්‍යාපෘතියේ ඇතුලත් වූ කාර්යයකි. | -එම- |
| (ඇ) | කෝස්ටික් සෝඩා වලට වටිනාකම් එකතු කිරීම සඳහා හා පරන්තන් කෙමිකල්ස් ආයතනයට දැනට ලබාගත නොහැකි වෙළඳපොල වෙත ළඟාවීමේ අරමුණින් කෝස්ටික් සෝඩා දියර සෑදීමේ ව්‍යාපෘතියක් 2015 දෙසැම්බර් මස 30 දින කළුතර නාගොඩ කර්මාන්තපුරයේ ආරම්භ කර ඇති අතර 2016 අප්‍රේල් 25 දින එහි වැඩ අවසන් කර තිබුණි. යන්ත්‍රය සකස් කිරීමට රු.2,089,000 ක වියදමක් දරා තිබූ නමුත් මෙම ව්‍යාපෘතිය සඵලදායී නොවීම හේතුවෙන් මෙම යන්ත්‍රය ගලවා ඉවත්කර භාවිතයකින් තොරව යන්ත්‍රයේ කොටස් භූමියේ තැන තැන දමා දිරාපත්වෙමින් තිබුණි. | කෝස්ටික් සෝඩා ව්‍යාපෘතියෙන් ගලවා ඉවත් කරන ලද යකඩ ටැංකි ජලය ගබඩා කිරීම සඳහා වගවත්ත ඒකකය වෙත යවා ඇති අතර මල නොබඳින වානේ ස්ක්‍රබර් පද්ධතිය කෝස්ටික් දිය කිරීමේ වල සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා මේ වන විට මූලික පියවර ආරම්භ කර ඇත. | සමාගමට අලාභයන් ඇති නොවන ලෙස නිසි අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.242,768,692 ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මෙය 2023 වර්ෂයේදි නිවැරදි කරනු ලැබේ. | වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අවස්ථා දෙකකදී බංග්ලාදේශයෙන් රු.38,644,540 ක් වටිනා කි.ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා බෑග් 5,997 ක් මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වූ 2023 ජූලි 12 දින වන විටත් මෙම තොගයෙන් රු.18,315,488 ක් වටිනා කි.ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා බෑග් 2,277 ක් එනම් සියයට 37 ක් ඉතිරි වී තිබුණු අතර, මෙම තොගයෙහි කල් | තරගකාරීව විකුණන කෝස්ටික් සෝඩා සඳහා අලෙවි ආදායමක් ලබා ගැනීමේ අරමුණින්, මෙම තොග මිලදී ගන්නා ලදී. ලංකා Sugar සමාගමෙන් මෙ.ටොන් 40 ක ඇණවුමක් හා රජයේ තවත් ටෙන්ඩර් කිහිපයක් සඳහා මිළ ගණන් ඉදිරිපත් කොට, ඒවා ද | සමාගමට අලාභයන් ඇති නොවන ලෙස තීරණ ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉකුත්වීමේ දිනය 2023 අගෝස්තු 26 දින ලෙස සටහන් කර තිබුණි. | ආයතනයට ලැබීමට නියමිතව තිබුණි. පසුව අපේක්ෂා කළ පරිදි රාජ්‍ය ආයතනවලින් ස්ථිර ලෙස ඇණවුම් ලබා නොදීම හේතුවෙන්, එම තත්ත්වයට මුහුණ දීමට සිදු විය. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.722,084,984 ක් වූ අතර පෙර වර්ෂයේ විකුණුම් ආදායම රු.395,462,174 ක් විය. කි.ග්‍රෑම් 68 ක් බරැති හා කි.ග්‍රෑම් 900 ක්, කි.ග්‍රෑම් 1000 ක් බරැති ක්ලෝරීන් සිලින්ඩර් විකුණුම් ප්‍රමාණය පෙර වර්ෂයට වඩා පිළිවෙලින් සියයට 6 ක් හා සියයට 20 ක් ලෙස අඩු වී තිබුණද විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 97කින් හා සියයට 75 කින් වැඩි වී තිබුණි. කෝස්ටික් සෝඩා විකුණුම් ප්‍රමාණය සියයට 64 කින් වැඩිවී තිබුණද එහි ආදායමේ වැඩිවීම සියයට 710ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 82 කින් ඉහළ යාමට ඒවායේ මිල ගණන් වැඩිවීම හේතු වී තිබුණි. | 2022 වසරෙහි ශ්‍රී ලංකාව තුල සිදුවූ ඩොලරයේ මිල ඉහල යාම සමග කුඩා පරිමාණ පාරිභෝගිකයින්ගේ අලෙවිය බිඳවැටීම නිසා සමහර ආයතන ඔවුන්ගේ නිශ්පාදන කටයුතු නවතා දමන ලදී. එම නිසා දියර ක්ලෝරීන් කි.ග්‍රෑ.68 සිලින්ඩර අලෙවියද අඩු වීමට හේතු විය.<br>ඉතා අරපිරිමැස්මෙන් ක්ලෝරීන් භාවිතය සිදු කිරීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ප්‍රමාණාත්මක අලෙවියද අඩු වී ඇති අතර ලෝක වෙළඳපොලේ ක්ලෝරීන් මිල ගණන් නැව් ගාස්තු හා අනිකුත් බදු වියදම් අධික වීම හා ඩොලරයේ අගය ඉහල යාම හේතුවෙන් මිලදී ගැනීමේ මිල ගණන් සීග්‍ර ලෙස ඉහල යෑම හේතුවෙන් විකුණුම් මිලද ඉහල යාමට හේතු වී ඇත. | විකුණුම් ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර නාගොඩ ෆුලර්ටන් කර්මාන්තපුරයේ පරන්තන් කෙමිකල් සමාගමට අයත් අක්කර දෙකකින් යුත් ඉඩමෙහි වර්ග අඩි 5250 කින් යුත් කාර්යාලීය දෙමහල් ගොඩනැගිල්ලේ උඩුමහල ඉහළ කළමනාකාරිත්වයට සරිලන ලෙස යාබඳ නානකාමර 2 කින් යුත් කාමර 2 ක්, රසායනාගාරයක් සහ සම්මන්ත්‍රණ ශාලාවකින් සමන්විත වන අතර දැනට කිසිදු භාවිතයකින් තොරව හිස් දියර බෝතල් හා ආරක්ෂණ ඇඳුම් කට්ටල අසුරා තබන ගබඩාවක් ලෙස භාවිතා කරනු ලබයි. එම හේතුවෙන් මෙම කාර්යාල ගොඩනැගිල්ල ඌන උපයෝජිතව භාවිතා කරන බව දක්නට ලැබුණි. | කළුතර ඒකකය මහින් වගවත්ත ඒකකය තුළ නිශ්පාදනය කරනු ලබන බ්ලීචින් දියර බෝතල් සහ කෑන් ඒකකය තුල ගබඩා කර තබාගැනීමට අවශ්‍ය වේ. එම බෝතල් සහ කෑන් වල රළු මතුපිටක් මත ගබඩා කිරීම මහින් ඒවාට හානි වන බැවින් ටයිල් මතුපිටක් සහිත බ්ලීචින් පිරවීම් ගොඩනැගිල්ලේ ඇති 'TO කාමරයේ' සහ අතිරික්තය පරිපාලන ගොඩනැගිල්ලේ එක් කාමරයක ගබඩා කර ඇත. පරිපාලන ගොඩනැගිල්ලේ පහළ මාලයෙහි කළමණාකරන සහකාරවරුන් දෙදෙනෙක් සහ එක් නිලධාරිනියක් සේවය කරන අතර ඉහළ මාලයේ රසායනාගාරය තාක්ෂණ නිළධාරිනිය විසින් භාවිතා කරනු ලබයි. | කාර්යාල ගොඩනැගිල්ක් ගබඩාවක් ලෙස භාවිතා නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වගවත්ත පිරවුම්හලේ භාවිතයට ගත නොහැකි ක්ලෝරීන් සිලින්ඩර් 11 ක් නම්කර ඇති අතර එම සිලින්ඩර් වෙන්දේසි කර විකිණීමට යෝජනා කර තිබුණද විගණිත දිනය වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම සිලින්ඩර් වෙන්දේසි කිරීමට අදාල පුවත්පත් දැන්වීම 2023.08.22 දිනැති දිනමිණ පුවත්පතෙහි පළ කොට ඇත. | භාවිතයට ගත නොහැකි අබලි කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 227 කින් යුත් පරන්තන් භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබුණු අතර, ඒ සඳහා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ශක්‍යතා අධ්‍යයන වෙනුවෙන් හා පරන්තන් ඉඩම සංවර්ධනය හා ශාක වගා කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.6,469,444 ක් හා රු.4,693,617 ක් ලෙස වියදම් දරා තිබුණද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය මේ වන විට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව යන්ත්‍ර සූත්‍ර, සිවිල් ඉදිකිරීම් කටයුතු, ගබඩා පහසුකම්, ඉදිකිරීම් ආදී කටයුතු සඳහා පිරිවැය ඇ.ඩො.32.0 කි. 2022 අයවැයෙන් මේ සඳහා අරමුදල් ඉල්ලා තිබෙන අතර ඉතිරි මුදල ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති ණයක් සහ පරන්තන් කෙමිකල් සමාගමේ ඉතුරුම් මගින් සපයා ගත යුතුය.<br>කෝස්ටික් සෝඩා ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2023 අයවැයෙන් රුපියල් මිලියන 200 ක් ලැබී ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර මේ සඳහා සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය ලිපි ගොනුව රේඛීය අමාත්‍යංශයේ ලේකම්තුමා වෙත යොමු කර ඇත. | ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ පානීය ජල සුරක්ෂිතතාවට අවශ්‍ය දියර ක්ලෝරීන් ආනයනය කර ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට බෙදා හැරීම හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (HCL) සහ සෝඩියම් හයිපොක්ලෝරයිට් රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම නිරතව සිටින බැවින් ශ්‍රී ලංකාව තුළ යූරියා පොහොර නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පෞද්ගලික) ආයතනය මගින් ශක්‍යතා අධ්‍යනයක් කරවා ගැනීමට 2020 දෙසැම්බර් 31 දින රු.35,353,000 ක් සමාගමට ලබා දී තිබුණ ද, 2023 ජූලි මාසය වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර රේඛීය අමාත්‍යංශයෙන් ලද උපදෙස් පරිදි නැවත සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් SLINTEC ආයතනයෙන් ලබාගෙන ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට මුදල් අමාත්‍යංශයට ලිපියක් යොමු කර ඇත. | ශක්‍යතා අධ්‍යයනය සිදුකර නිෂ්පාදනය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |